සන්නස SANNASA

# හොඳ සිංහල 9

**සිංහල ඉගෙන ගන්නට කැමති සැමට සන්නස සේවාවකි මේ**



**වි. ක. ධර්මබන්ධු**

**පසුගිය** පාඩමින් අප උගත්තේ භාෂාවක අකුරු පද සහ වියරණ රීති කලින් කලට වෙනස්වීම ස්වාභාවික සිද්ධියක් බවයි. ඒ වෙනස්වීම් හොඳ අතට මෙන්ම නරක අතටද සිදු විය හැකිය. කෙසේ වෙතත් මෙහි දී ගැටලුවක් මතු වේ. හොඳ අතට වෙනස්වීම කුමක් ද, නරක අතට වෙනස්වීම කුමක්ද යන්න තීරණය කරන්නේ කෙසේද? කවරෙක්ද? යන්නයි ඒ.

එක් එක් තැනැත්තාගේ රුචි අරුචිකම් අනුව ගඳ සුවඳ, ලස්සන (හැඩ) කැත, (කනට) මිහිරි අමිහිරි, රහ නොරහ, හොඳ නරක වෙනස්වීම් ඒ ගැටලුවයි. අපි (සිනමාවක්) මූවියක් හෝ ගීයක් ගැන හිතමු. එය හොඳයි කියන අය මෙන් ම එය නරකයි කියන අයත් සිටිති. ඒ දෙකටම නැති 'හොඳත් නැ නරකත් නෑ' කියන අය මෙන්ම ඒවා අපි දන්නෑ අපි බලනවා / අහනවා' කියන අයත් සිටිති.

භාෂාවක හොඳ වෙනස්වීම් සහ නරක වෙනස්වීම් තීරණය කිරීමේදී නිරවුල් බව, පැහැදිලි බව, ක්‍රමවත් බව සහ පහසුව ගැන සිතීම මැනවැයි සිතමි.

'ලස්සන' යන වචනය වැරදියි. එය 'ලක්ෂණ' යන වචනයේ 'බාල කොපියක්' කියා එය ඉවත් කළ යුතු ද? රූමතා රූමතිය වෙනුවට කෙනකු 'ලස්සනයා ලස්සනිය' වැනි වචනයක් යෙදුවහොත් අප එයට උදහස්විය යුතුද?

'සුබස් සමුළුවක්' රැස් වී වචන හදන සිරිතක් නැත. දිහිවරයා (ධීවරයා)

**දිහිවරයා (ධීවරයා) මසකු අල්ලා ගෙන උඹට නමක් තැබීම සඳහා පඬිවරුන් සොයා නොයයි. ඔහු උගේ හැඩ රුව ගති ගුණ බලා හෝ කටට ආ නමක්' උඹට තබනු ඇත.**

මසකු අල්ලා ගෙන උඹට නමක් තැබීම සඳහා පඬිවරුන් සොයා නොයයි. ඔහු උගේ හැඩ රුව ගති ගුණ බලා හෝ කටට ආ නමක්' උඹට තබනු ඇත. පැන්නා කාරල්ලා, තෙලියා, ලාග්ගා, හුරුල්ලා එබඳු නම්ය. ඔහු ඉන්පසු හැමදාමත් ඒ මසා ඒ නමින්ම හඳුන්වනු ඇත. ටිකින් ටික සෙස්සෝද ඒ නමට හුරු වෙති.

භාෂාවක් ගොඩනැගී ඇත්තේ කිසියම් පදනමක් මතයි. භාෂාව භාවිතා වන්නේ ඒ පදනම හෙවත් රාමුව මතයි. අවශ්‍යතා අනුව කලින් කලට ඒ පදනමේ වෙනස්කම් සිදුවීම් - සිදු කිරීම සිරිතයි. පවත්නා පදනම වෙනස් නොකොට ඉදිකිරීම් කළ හැකි ද යන්න නොදනිමි. එහෙත් මාගේ අද්දැකීම් සහ අවබෝධය අනුව නම් එය බැහැර කළ යුතු සදොස් පිළිවෙතයි. එය පදනම නොතකා - පදනමෙන් පිටත බඳින බිතක් (බිත්තියක්) වැනිය.

'මිටි' ශබ්දය මිට - මිටි, මිටට - මිටිවලට, මිටෙන් - මිටිවලින්, මිටේ - මිටිවල සහ මිටිය - මිටි, මිටියට - මිටිවලට, මිටියෙන් - මිටිවලින්, මිටිවලින්, මිටියේ - මිටිවල ආදී වශයෙන් දෙවිදියකට වරනැගෙන බව ඔබ දනිති. එහි තේරුම් ද වෙනස් ය. ඒ පද සැකසී ඇත්තේ,
අ - ෆ (වල්), අට - ෆ වල්ෑඅට, ඉන් / එන් - වල් ඉන්, ඒ / එහි - ෆ වල්ෑඅ
(කන /කට - කන් / කටවල් , කනට / කටට -
කන්වලට / කට(වල්) වලට , කනින් / කටින් -
කන්වලින් / කට(වල්) වලින්, කනේ / කටේ -
කන්වල / කට(වල්)වල) යන නපුංසක ලිංග විභක්ති ප්‍රත්‍ය එක් වීමෙනි.

'මිටියේ මිටි බුරුල් වී ඇත' යන වැකියේ 'මිටිය' යනු ටූහුලකි (Tool)' 'මිට' යනු එය හා බැඳි අත්දණ්ඩයි. 'මිටි' ශබ්දය විවිධ අර්ථවල යෙදේ.

1. මිටිය මල කා ඇත
2. දර මිටිය බර නැත
3. හැඳි මිට දිග වැඩිය
4. මුත්තාගේ වැලමිට ඉදිමී ඇත
5. මම අත මිට මොලවා ගතිමි
6. මා නෙළූ පළා මිට අම්මාට දුනිමි

මිටි, පුටු, කස, පා, රූ, හී, පෙරෝ වැනි ස්වරාන්ත ශබ්ද මෙන්ම ඇස්, කන්, ගස් වැනි හලන්ත ශබ්ද ද වරනැඟෙන්නේ එක් ම විදියට ය. පුටූඅ =පුටුව, කසූඅ = කසය, පාූඅ = පය, රූූඅ = රුව, හීූඅෑ= හීය, පොරෝෑඅ = පො-

27 පිටට

